ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I සහ II ශ්‍රේණියේ නිලධාරීන් වෙත,

**<u>ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ මුලතිව්, කිළිනොච්චි සහ පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරු වල රාජකාරි ආවරණය කිරීම සඳහා එකඟතාවය විමසීම</u>**

දැනට පුරප්පාඩු වී ඇති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ මුලතිව්, කිළිනොච්චි සහ පොළොන්නරුව දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරුවල වැඩ බැලීම සඳහා කැමැත්තක් දක්වනු ලබන , සේවා ව්‍යවස්ථාව අනුව සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ නිලධාරීන් සිය මනාපය , අදාළ ආසන්නතම අධීක්ෂණ නිලධාරි හෝ ආයතන ප්‍රධානී මඟින් 2024.12.24 දිනට පෙර පාලන 1 ශාඛාව වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. ( email - <u>admin1moa@agrimin.gov.lk</u> ) ෆැක්ස් අංකය - 0112871973 . අදාළ ලකුණු ලබා දීමේ පරිපාටිය ඇමුණුම 1 ලෙස මේ සමඟ අමුණා ඇත.

02. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් අතරින් I ශ්‍රේණියට උසස්වීම සඳහා සියලු සුදුසුකම් මේ වනවිට සම්පූර්ණ කර ඇති II ශ්‍රේණියේ නිලධාරීන්ට ද රාජකාරි ඉටු කිරීම සඳහා එකඟතාවය පල කළ හැකි බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

03. තව ද මෙම I ශ්‍රේණියේ තනතුරු ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථාවේ පරිදි විධිමත්ව පුරප්පාඩු පිරවීම හෝ වසරක කාලයක් යන දෙකෙන් කලින් එළඹෙන දිනයක් තෙක් වලංගු වේ.

මේනකා ප්‍රියන්තා අබේරත්න
අතිරේක ලේකම් (පාලන හා මානව සම්පත් සංවර්ධන)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට